IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස

## ප්‍රථම සෙමෙස්තරය - 2017/18

(පවත්වන ලද්දේ 2020 පෙබරවාරි)

## BLE 101 - සූක්ෂම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (I) හිඟකම, තෝරාගැනීම සහ තරඟය යන සංකල්ප නිර්වචනය කරන්න. උදාහරණ එක බැගින් සපයන්න.

(ලකුණු 05)

(II) මූලික ආර්ථික ප්‍රශ්න නම් කරන්න.

(ලකුණු 03)

(III) නිෂ්පාදනය පිළිබඳ ගැටළුව තාක්ෂණය පිළිබඳ ගැටළුවෙන් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 03)

(IV) ධනවාදී ආර්ථික ක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වා එහි මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04)

(V) ශ්‍රම විභාජනය, විශේෂීකරණය සහ අපනයන ප්‍රවර්ධනය යන සංකල්ප අතර පවතින සම්බන්ධතාවය ඇඟළුම් කර්මාන්තය උදාහරණයට ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. (I) වෙළඳ පොළ ඉල්ලුම යන්න නිර්වචනය කරන්න. එය තීරණය කරණ ප්‍රධාන සාධක හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(II) ඉල්ලුම් න්‍යාය යනු කුමක්ද? එයට බලපාන සාධක මොනවාද?

(ලකුණු 05)

(III) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත සේ දී ඇත.

$Qd = 100 - 5p$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = 40 + 5p$ (සැපයුම් සමීකරණය)

(අ) සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය සොයන්න.

(ලකුණු 05)

(ආ) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතාවය සහ සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03. (I) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළඳපොලක විකිණිය හැකි උපරිම මිල රජය මගින් තීරණය කලහොත් වෙළඳ පොලට ඇතිවන බලපෑම රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) භාණ්ඩයක් මත රජය ඒකක බද්දක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක ප්‍රස්ථාර සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(III) භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය සහ ව්‍යාපාරිකයාගේ අයභාරය අතර ඇති සම්බන්ධතාවය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(IV) භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධක මොනවාද? (ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. (I) කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයා ලබන මුළු උපයෝගීතාවය පහතන වගුවෙන් දී ඇත.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| X භාණ්ඩයේ පරිභෝජනය කරන ඒකක සංඛ්‍යාව | 0 | 1 | 2 | 3 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| X භාණ්ඩයෙන් ලබන මුළු උපයෝගිතා ඒකක ගණන | 0 | 10 | 19 | 27 | 34 | 40 | 45 | 49 | 53 | 54 | 55 | 55 |

(අ) එක් එක් ඒකකයක් පාරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයා ලබන ආන්තික උපයෝගීතාවය ගණනය කරන්න. (ලකුණු 05)

(ආ) ඉහත තොරතුරු ඇසුරෙන් මුළු උපයෝගීතාවය සහ ආන්ති උපයෝගීතාවය දැක්වෙන ප්‍රස්ථාරයක් ගොඩනගන්න. (ලකුණු 05)

(II) උපේක්ෂා වක්‍ර විග්‍රහයට අනුව පාරිභෝගික සමතුලිතය ඇතිවන ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(III) මිල පරිභෝජන රේඛාව සහ ආදායම් පරිභෝජන රේඛාව අතර වෙනස ප්‍රස්ථාර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 20)

05. (I) මුළු නිෂ්පාදනය, සාමාන්‍ය නිෂ්පාදනය, ආන්තික නිෂ්පාදනය යන සංකල්ප පැහැදිලි කොට ඒවායේ වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 04)

(II) කිසියම් ආයතනයක් නිපදවන භාණ්ඩයක ආන්තික නිෂ්පාදනය සහ සාමාන්‍ය නිෂ්පාදනය හැසිරෙන ආකාරය ප්‍රස්ථාරයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(III) කෙටිකාලීන නිෂ්පාදනය සහ දිගුකාලීන නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(IV) "නිෂ්පාදන ශ්‍රිතය " යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 04)

(V) "කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයට" අනුව නිෂ්පාදනයේ දී ඇතිවන අවධි 3 පැහැදිලි කරන්න.

සාමාන්‍යයෙන් නිෂ්පාදකයා දෙවන අවස්ථාව තෝරා ගන්නේ ඇයි? (ලකුණු 04)

(මුළු ලකුණු 20)

06. (I) ස්ථාවර පිරිවැය, විචල්‍ය පිරිවැය, මුළු පිරිවැය යන සංකල්ප ප්‍රස්ථාර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) කෙටිකාලීන නිෂ්පාදන පිරිවැය සහ දිගුකාලීන නිෂ්පාදන පිරිවැය අතර වෙනස ප්‍රස්ථාර සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(III) කෙටිකාලීන සහ දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර  ආකාරයක් ගැනීමට හේතු මොනවාද? (ලකුණු 05)

(IV) හීනවන ආන්තික පලදා න්‍යාය යන්න උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07. (I) පූර්ණ තරඟකාරී වෙළඳ පොළක උපකල්පන මොනවාද?

(ලකුණු 05)

(II) පූර්ණ තරඟකාරී වෙළඳ පොළක ක්‍රියාත්මකවන ආයතනයක සමතුලිතය ඇතිවන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(III) "පූර්ණ තරඟකාරී වෙළඳ පොළක ක්‍රියාත්මක වන ආයතනයක් දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ පමණක් ලබයි." මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 05)

(IV) පූර්ණ තරඟකාරී වෙළඳ පොළ ක්‍රමයක වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

08. (I) ඒකාධිකාරය නිර්වචනය කොට එහි ප්‍රධාන ලක්ෂණ 3 සඳහන් කරන්න.

(ලකුණු 05)

(II) ඒකාධිකාරී ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් වක්‍රයේ ස්වරූපය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(III) ඒකාධිකාරී වෙළඳ පොළක සමතුලිතය ඇතිවන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(IV) කතිපයාධිකාරිය සහ ඒකාධිකාරී තරගය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 05)